බාලවයස් දැරියන් නීත්‍යානුකූල භාරකාරත්වයෙන් අපහරණය කොට, ලිංගික අපයෝජනයකට ලක් කිරීමේ චෝදනා පිට සැකකරුවන් අත්අඩංගුවට ගැනීමේ සිදුවීම් දෙකක් පුවත්පත් දෙකක් (පෙබ. 24, 2023) තුළ වාර්තා වී තිබූ ආකාරය මෙසේ දැක්විය හැක.
* දිනමිණ - "හූනියමක් කැපීමට ආ කට්ටඩියා දැරිය පන්නගෙන ගිහින්" ("දූෂණයක්" යැයි අන්තර්ගතයේ සඳහන් වේ).
* දිවයින - "දැරිය රැවටූ පෙම්වතාට වැඩ වරදී" ("දූෂණයක්" යැයි අන්තර්ගතයේ සඳහන් වේ).
1) බාලවයස් ලිංගික අපයෝජනයක් යනු, නීතියෙන් දඬුවම් ලැබෙන වරදකි. එසේ වුවත්, මෙම සිරස්තල ඔස්සේ එම වරදෙහි බරපතල භාවය සන්නිවේදනය වෙතැයි ඔබ සිතන්නේ ද?
2) එසේ සන්නිවේදනය නොවන්නේ නම්, මෙම සිරස්තල ඔස්සේ බාලවයස් ලිංගික අපයෝජනයක් සැහැල්ලු කොට නොදැක්වෙන්නේ ද? එය මෙවැනි වැරදි සමාජය තුළ සාමාන්‍යකරණය වීමට ද හේතුවක් නොවන්නේ ද?
3) ලිංගික අපයෝජනයකට මුහුණ පෑවෙකු අපවිත්‍ර වූ බවට හැඟීමක් ලබාදෙන "දූෂණය" වැනි යෙදුම් කෙතරම් යෝග්‍ය ද? ඒ වෙනුවට, "ලිංගික අපයෝජනය" වැනි යෙදුමක් යොදාගත නොහැකි ද?
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

